**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය**

1. සම්බන්ධ ආයතන

| | | |
|---|---|---|
| 1.1. | දෙපාර්තමේන්තුව | බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>යොමු අංකය : 1/2/6/2/11 දිනය: 2017.11.28 |
| 1.2. | අමාත්‍යාංශය | බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය<br>යොමු අංකය : කෘ/ආපා/ව/ස්ථාපන/ සාමා. යාන. දිනය : 2017.12.30 |
| 1.3. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය : DMS/D/පොදු/11/2 දිනය 2012.12.19 |
| 1.4. | ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය | යොමු අංකය : CSO/PTR/12/2/13 දිනය 2018.01.22 |
| 1.5. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : දිනය |
| 1.6. | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : දිනය |
| 1.7. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය : දිනය |

2. පත්කිරීම් බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : C-1/A7-1/4/1/2/3
දිනය : 2018/5/14

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය / සේවා ගණ - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

3.2. ශ්‍රේණි - III, II සහ I.

3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය -

විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳව පුහුණුව ලබා ගත යුතු, ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික, ද්‍රව්‍යමය තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයෙන් යුත් අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම සුදුසුකම්ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමනාකරණ සේවා වන කෘෂිකර්ම වෘත්තීමය සේවාවට පරිපූරකවන්නා වූ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

4. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය

5. වැටුප්

5.1. වැටුප් කේත අංක - III II I ශ්‍රේණි - රා.ප.ච.03/ 2016 - MN 03 - 2016

5.2. වැටුප් පරිමාණය - රු.31040 -10x445- 11x660- 10x730- 10x750- 57550

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | 01 | රු.31040/- |
| II | 12 | රු.36150/- |
| I | 23 | රු.43480/- |

**සටහන :** බඳවා ගැනීම්, උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී අංක 03/2016 චක්‍රලේඛයේ උපලේඛණ I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් කළ යුත්තේ , උපලේඛණ II හි සඳහන් පරිදි බැවි පත්වීම් ලිපියෙහි සඳහන් කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : G-3/ HA/-/-/2/33 2018/5/11

6. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ගොවිපල යාන්ත්‍රික උපදේශක | III<br>II<br>I | 04 | කෘෂිකාර්මික යන්ත්‍ර, උපකරණ, ආම්පන්න ක්‍රියාකාරිත්වය, භාවිතය, අලුත්වැඩියාව හා නඩත්තුව පිළිබඳ පුහුණුකරුවකු / උපදේශකයකු ලෙස කටයුතු කිරීම, කෘෂිකාර්මික වාහන, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ආම්පන්න අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ වගකීම දැරීම හා අදාළ කටයුතුවල දී කාර්ය මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ අධීක්ෂණ කටයුතු. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: 04

ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්යය සඳහා සේවා ගණයේ III, II, I ශ්‍රේණි සියල්ල, ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් : පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම්

(අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, යාන්ත්‍රික තාක්ෂණවේදය යන විෂයයන්ගෙන් දෙක (02) ක් සහිතව විද්‍යා / තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ....................
දිනය : ....................

7.2.2.2. වෘත්තීය සුදුසුකම්

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (යාන්ත්‍රික) ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා (යාන්ත්‍රික) ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

III. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික) ලබා තිබීම

හෝ

IV. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (යාන්ත්‍රික) ඩිප්ලෝමාව

හෝ

V. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

VI. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා, අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව / මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව, වැල්ඩින් කිරීම, යාන්ත්‍රික වැඩපල ශිල්ප ක්‍රම පිළිබඳ සුදුසුකම් ලබා තිබීම.

හෝ

VII. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සම්පූර්ණ කිරීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් - බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.2.2.5 වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :-

7.2.3.1 අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු.

7.2.3.2 උපරිම සීමාව - අවුරුදු 30 ට නොවැඩි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 603/A9/12/337
දිනය : 2018/5/11

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය:

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 % |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40 % |

(විෂය නිර්දේශය - ඇමුණුම 01)

7.2.4.1.1 පවත්වන බලධරයා : බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධරයා

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ...
දිනය : ...

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඊට අමතරව වෙබ් අඩවියේ ද දැන්වීම් පළ කළ හැකිය.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ .

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

8 කාර්යක්ෂමතා කඩඉම් විභාග

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 2) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 3) |
| III වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? : වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

(අ) පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි.

(ආ) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණ පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි.

සටහන : මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වනවිට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

9 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ දී ලබාගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමේ ප්‍රවීණතාවක් 111 වන ශ්‍රේණියේ වසර පහ (05) ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

**10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම**

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 603/147-1/1/7/337
දිනය : 2016/05/14

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VI. අදාළ මට්ටමේ සන්ධාන භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

VII. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව (ඇමුණුම 04) ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 04 ) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ.

සටහන: සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධරයන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

11. තනතුරු වලට පත් කිරීම - අදාළ නොවේ.

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................
දිනය : ..................

12.1. පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම.

විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ගොවිපල යාන්ත්‍රික උපදේශක III ශ්‍රේණියට බඳවාගන්නා නිලධරයෙකු වසර තුන (03) ක පරිවාස කාලයකට යටත් වේ. ඔහු / ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ ස්ථිර කරනු ලැබේ.

12.2. රජය විසින් හෝ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවයන් ද සියළුම නිලධරයන් විසින් නියමිත පරිදි ලබාගත යුතුය.

13. අර්ථ නිරූපන

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය :

"සතුටුදායක සේවා කාලය"

I. පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද. එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම් සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

II. නිලධරයෙකු වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛණය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

"සක්‍රිය සේවා කාලය"

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

"නියමිත දිනට"

අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධරයන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධරයන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

14. අන්තර්ග්‍රහණ විධිවිධාන :

14.1. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MN-03 2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධරයන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධරයාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවන අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වේ. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ නිලධරයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොවේ.

14.3. මෙම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට සේවයේ නියුතු නිලධරයන් නව බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරට අන්තර්ග්‍රහණය කිරීම පහත සඳහන් ආකාරයට සිදු කරනු ලැබේ.

14.3.1. ගොවිපල යාන්ත්‍රික උපදේශක III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.
මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක II වන පන්තිය (ආ) ඛණ්ඩයේ සිටින නිලධරයන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.3.2. ගොවිපල යාන්ත්‍රික උපදේශක II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.
මෙම බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක II වන පන්තිය (අ) ඛණ්ඩයේ සිටින නිලධරයන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.3.3. ගොවිපල යාන්ත්‍රික උපදේශක I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.
මෙම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක I වන පන්තියේ සිටින නිලධාරින් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. අන්තර්කාලීන විධිවිධාන.
අන්තර්කාලීන විධිවිධාන 2018.06.01 දක්වා බල පැවැත්වේ. මෙම බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට III වන හා II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධරයන්ට උසස්වීම් ලබාදීමේ දී අන්තර්කාලය තුළ දී අදාළ කරගත යුත්තේ මීට පෙර අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිවල අදාළ වගන්ති වේ. (අනෙකුත් කොන්දේසි මෙම බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය අනුව වේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :
දිනය : 2018/5/11

16. වෙනත් :

16.1. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16.2. මෙම බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටියෙහි විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවකදී හා / හෝ මෙම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කළේ: අත්සන ....................................

පරීක්ෂා කළේ: ....................................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :

ඒ.ටී. ගු. මෙන්ඩිස්
කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 124,
මහාචාර්ය ගන්දදාස කෝදාගොඩ මාවත
කොළඹ 07.

දිනය : 2017.11.28

නිල මුද්‍රාව

යොමු අංකය: ....................................

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
යොමු අංකය : ....................................
දිනය : ....................................

අත්සන ....................................
නම :
ලේකම්
කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, ඉඩම්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය , ධීවර අමාත්‍යාංශය, බස්නාහිර පළාත.

දිනය :- 2017-12-20

නිල මුද්‍රාව

එන්. නිල්වල
ලේකම්
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)
ශ්‍රාවස්ති මන්දිරය,
තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

යොමු අංකය: CSO/PTR/12/2/1/13

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන ..........

නම : ..........

ප්‍රධාන ලේකම් (බ.ප.)

දිනය:- 2018. 01. 22

නිල මුද්‍රාව ප්‍රදීප් යසරත්න ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය: WPC/PSC/ADM/16/4/102.

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
යොමු අංකය : ..........
දිනය : 2018/5/11

අත්සන ..........

නම : ..........

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

දිනය:- 2018.05.02

නිල මුද්‍රාව එම්. ජී. ඒ. තිලකරත්න ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව බස්නාහිර පළාත

යොමු අංකය: ..........

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය 2018/5/11 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන ..........

නම : ..........

ආණ්ඩුකාර ලේකම්

දිනය: 2018/5/17

නිල මුද්‍රාව පී. සෝමසිරි ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

ඇමුණුම - 01

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**

1. **විභාගයේ නම:** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය.

2. **විභාගය පිළිබඳ විස්තර**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

3. **පවත්වන බලධරයා:** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. **විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්නවලින් යුක්තය. | |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පෑස්සුම් | දැනට භාවිතයේ පවතින විවිධ ආකාරයේ පෑස්සුම් පිළිබඳ මූලධර්ම.<br>පෑස්සුම් කිරීමේදී භාවිතා කරන ආම්පන්න වල සීරු මාරු කිරීම.<br>පෑස්සුම් කටයුතු සඳහා ලෝහ ද්‍රව්‍ය සකස් කිරීම. |
| | කම්මල් වැඩ | කම්මල් වැඩ සඳහා භාවිතා කරන උපකරණ හා ආම්පන්න<br>කම්මල් වැඩ සඳහා ලෝහ කොටස් පිළියෙල කිරීම.<br>විවිධ ලෝහ වර්ග හඳුනාගැනීම.<br>විවිධ හැඩයන් අනුව ලෝහ කොටස් තලා ගැනීමේ ක්‍රම |
| | වඩු වැඩ | වඩු වැඩ සඳහා භාවිතා කරන උපකරණ හා යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය සීරුමාරු කිරීම හා නඩත්තුව පිළිබඳ දැනුම<br>විවිධ දැව වර්ග හඳුනාගැනීම.<br>වඩු වැඩ වල දී යොදාගන්නා පූට්ටු<br>දැව ආලේපන හා ඔපකිරීම පිළිබඳ දැනුම |
| | වැඩපල යන්ත්‍ර | ලියවන පට්ටල් වර්ග, ඒවායේ ක්‍රියාකාරිත්වය හා නඩත්තුව.<br>විවිධ කාර්යයන් සඳහා යොදා ගත යුතු යන්ත්‍ර තෝරාගැනීම.<br>විදුලි යන්ත්‍ර සහ සාමාන්‍ය වැඩපලක තිබිය යුතු යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය.<br>සීරු මාරුකිරීම හා නඩත්තුව. |
| | තහඩු වැඩ | විවිධ හැඩයන් ලබාගැනීම සඳහා තහඩු සලකුණු කිරීම<br>අවශ්‍ය හැඩයට නැමීම හා පෑස්සීම<br>තහඩු වැඩ සඳහා යොදා ගන්නා ආම්පන්න |
| | කැපුම් තල | වැඩපලවල භාවිතා කරන යන්ත්‍ර සඳහා වන කැපුම්තල |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :
දිනය :

| | | |
|---|---|---|
| | හා මිනුම්<br>උපකරණ | නිසි පරිදි මුවහත් කිරීම<br>කැපුම්තල වර්ග හඳුනාගැනීම |
| | ද්‍රව්‍යවල ගුණ<br>හා සරල<br>ගණනය<br>කිරීම | විවිධ ද්‍රව්‍යයන් හඳුනාගැනීම, ද්‍රව්‍ය මත බල ක්‍රියාකිරීමේදී හැසිරීම.<br>පරිමාව, බලය, බල ඝූර්ණය, කාර්යය, කාර්යක්ෂමතාවය වැනි සරල ගණනය කිරීම්.<br>ලෝහ මත තාපයේ ක්‍රියාව. |
| | මෝටර්<br>යාන්ත්‍රික<br>විද්‍යාව | ස්නේහනයේ වැදගත්කම, ස්නේහන ක්‍රම හා ඒවායේ දෝෂ නිර්ණය කිරීම.<br>ස්නේහන වර්ග හා ඒවා යෙදීම සඳහා භාවිතා කරණ උපකරණ<br>ටයර් හා ටියුබ් හඳුනාගැනීම, ටයර් හා ටියුබ්වල සේවාවන් කිරීම<br>මෝටර් වාහන වල එන්ජින් කොටස්, ක්ලච් පද්ධතිය, ගියර් පද්ධතිය<br>බල සම්ප්‍රේෂණ පද්ධතිය හා වැසියේ විවිධ කොටස්වල ක්‍රියාකාරිත්වය<br>දෝෂ නිර්ණය කිරීම හා අළුත්වැඩියාවන්<br>වාහන බොඩි කොටස්වල තහඩු වැඩ හා පින්තාරු කිරීම |
| | විදුලි<br>ඉංජිනේරු<br>විද්‍යාව | විදුලි මිනුම් හා උපකරණ<br>විදුලි මෝටර් හා විදුලි උත්පාදන යන්ත්‍ර<br>පරිපථ හඳුනාගැනීම<br>වාහන හා කෘෂි යන්ත්‍රවල විදුලි පද්ධති |

සකස් කළේ: අත්සන.............................
(විෂය භාර නිලධාරියා)
නම: ජී.එම්.එම්.පෙරේරා
තනතුර: සංවර්ධන නිලධාරි
දිනය : 2017.11. 28

පරීක්ෂා කළේ: අත්සන.............................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)
නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරි
දිනය : 2017.11. 28

අත්සන: ..............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා
නම : අයි.යූ.මෙන්ඩිස්
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය : 2017.11. 28

අයි. යූ. මෙන්ඩිස්
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 124,
මහාචාර්ය සන්දදාස කෝදාගොඩ මාවත
කොළඹ 07.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගො/ආ.ලේ/4/7/337
දිනය : 2018/5/14

ඇමුණුම - 02

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි 111 ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**

1. **විභාගයේ නම:** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි 111 ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. **විභාගය පිළිබඳ විස්තර**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති. | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. **විභාගය පවත්වනු ලබන බලධරයා:** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

4. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

5. **විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති. ආයතන සංග්‍රහයේ - VIII, XII, XIII, XIV, XIX, පරිච්ඡේද. |
| මුදල් රෙගුලාසි | I වැනි පරිච්ඡේද, මුදල් රෙගුලාසි 01 සිට 68 දක්වා, III වැනි පරිච්ඡේද මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා. |

සකස් කළේ: අත්සන.......................
(විෂයභාර නිලධාරියා)
නම: ජී.එම්.එම්.පෙරේරා
තනතුර: සංවර්ධන නිලධාරි
දිනය : 2017.11. 28.

පරීක්ෂා කළේ: අත්සන.......................
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)
නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරි
දිනය : 2017.11. 28

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : G-5/60-14/7/332
දිනය : 2018.5.11

අත්සන: .......................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා
නම : අයි.යූ.මෙන්ඩිස්
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය : 2017.11

අයි. යූ. මෙන්ඩිස්
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 134,
මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත
කොළඹ 07.

ඇමුණුම 03

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර(තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි 11 ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**

1. **විභාගයේ නම:** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි 11 ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. **විභාගය පිළිබඳ විස්තර**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. **විභාගය පවත්වනු ලබන බලධරයා:** බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්

4. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක් පවත්වනු ලැබේ.

5. **විභාගය සඳහා විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII පරිච්ඡේද |
| මුදල් රෙගුලාසි | VI පරිච්ඡේද, මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා.<br>XIII වෙනි පරිච්ඡේද මුදල් රෙගුලාසි 685 සිට 775 දක්වා. |

සකස් කළේ: අත්සන...................
(විෂයභාර නිලධාරියා)

නම: ජී.එම්.එම්.පෙරේරා
තනතුර: සංවර්ධන නිලධාරි
දිනය : 2017.11. 28

පරීක්ෂා කළේ: අත්සන..........................
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2017.11. 28

අත්සන: ..........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම : අයි.යූ.මෙන්ඩිස්
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
දිනය : 2017.11.28

අයි. යූ. මෙන්ඩිස්
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ...)
අංක 134,
මහාචාර්ය ස්ටැන්ලි ...
කොළඹ 07.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ..........
දිනය : ..........

ඇමුණුම 04

## ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

1. නිලධරයා පිළිබඳ තොරතුරු
   - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ....................................................................................
     ....................................................................................
   - 1.2 හැඳුනුම්පත් අංකය : ....................................................................................
   - 1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ....................................................................................
     ....................................................................................
   - 1.4 අයත්වන ශ්‍රේණිය හා තනතුර : ....................................................................................
   - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ....................................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු
   - 2.1 පත්වීම් දිනය : ....................................................................................
   - 2.2 පත්වීම ස්ථිර කළ දිනය : ....................................................................................
   - 2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
යොමු අංකය : ....................
දිනය : ....................

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   - 2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාළ තොරතුරු
   - 3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II/ I
   - 3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය
   - 3.3 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත.
   - 3.4 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ....................................................................
   - 3.5 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත.
   - 3.6 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත.
   - 3.7 උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද ? ඔව් /නැත.
   - 3.8 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත.

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් .............................. දින සිට සාමාන්‍ය කාර්ය සාධනය II/ I ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ..................................

..............................................
නිලධරයාගේ අත්සන

5. ආයතන ප්‍රධානගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, .......................................................................................... .......................................... මහතා/ මිය/ මෙනවිය අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක .................. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහිමකට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : [illegible]
දිනය : 2018/5/11

අත්සන ...........................................

දිනය:

නම සහිත නිල මුද්‍රාව

6. දෙපාර්තමේන්තු ප්‍රධානගේ නිර්දේශය .

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් නිලධරයා අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරේ .............. ශ්‍රේණියට ................... දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත් වෙමි. ඒ අනුව නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

අත්සන .........................

දිනය :

නම සහිත නිල මුද්‍රාව

7. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත්/ නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශය හා එකඟ වන බවත්,/ නොවන බවත් කාරුණිකව දන්වමි.

අත්සන ..........................................

දිනය :

නම සහිත නිල මුද්‍රාව

## 8. ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ............................................................ මහතා/ මහත්මිය /මෙනවිය අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරේ .................. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ .................... දින සිට උසස් කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ............................................

දිනය :

නම සහිත නිල මුද්‍රාව

## 9. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් / පත්වීම් බලධරයා.

ඉහත සඳහන් සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ............................................................ මහතා / මහත්මිය / මෙනවිය අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරෙහි ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ .................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................
දිනය : ..................

නම :

අත්සන :

දිනය :

නිල මුද්‍රාව :